| **Number of Through units 77'x6x4 complete with 2x2 welded mesh and nylon**<br>නම්බර් ඔෆ් ටෲ යුනිට්ස් 77'x6x4 කම්ප්ලීට් විත් 2x2 වෙල්ඩඩ් මෙෂ් ඇන්ඩ් නයිලොන්<br><br>**Netting and air out put unit 5.5x2+1x7.5H.P. and 48' fan**<br>නෙටිං ඇන්ඩ් එයාර් අවුට් පුට් යුනිට් අ.බ. 5.5x2+1x7.5 ඇන්ඩ් 48" ෆෑන් | 03 |
| **Generator Caterpillar types 160 K.V.**<br>ජෙනරේටර් කැටපිලර් ටයිප්ස් 160 කි.වෝ. | 01 |

ඉහත සඳහන් දේපළ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ **2023 ක් වූ අගෝස්තු මස 04 වැනි දින පෙ. ව. 10.00** ට එම දේපළ සහ යන්ත්‍ර සූත්‍ර පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - දෙනියාය නගරයේ සිට හන්ස්ෆෝඩ් එස්ටේට් හරහා බෙරනපනාතර මාර්ගය ඔස්සේ සැතපුම් 6 1/2 ක පමණ දුරක් ගොස් දකුණු පසට ඇති මාර්ගයට හැරී ගිය විට අදාළ තේ කර්මාන්ත ශාලාව පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම* : රජයේ *ගැසට් පත්‍රයේ* 2023.05.12 වැනි දින පළ වී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් පුවත්පත්වල 2023.04.26 වැනි දින හා තිනක්කුරල් පුවත්පතේ 203.04.25 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු, විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000.00,
5. ලිපිකරු හා සෝෂක වේතන රු. 2,000.00,
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වේතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා විමසන්න : අයකර ගැනීමේ සහ පුනරුත්ථාපන අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.
දුරකථන අංක : 011 2371371

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011-2572940.

07 - 100

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ **2023 ක් වූ අගෝස්තු මස 04 වැනි දින පෙ. ව. 10.00 ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ E 451 ඉනාමළුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉනාමළුව පිහිටි ඉඩමට සර්වේයර් වෙනුවෙන් එච්. ඩී. එන්. කල්දේරා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2015.05.14 වැනි දිනැතිව සහතික කරනු ලැබ කැඩැස්තර සිතියම් අංක 310016 හි නිරූපිත අංක 92.

විශාලත්වය : රූ. 2, පර්. 5.8

2. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ E 451 ඉනාමළුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉනාමළුව පිහිටි ඉඩමට සර්වේයර් වෙනුවෙන් එච්. ඩී. එන්. කල්දේරා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2015.05.14 වැනි දිනැතිව සහතික කරනු ලැබූ කැඩැස්තර සිතියම් අංක 310016 හි නිරූපිත අංක 96.

විශාලත්වය : රූ. 1, පර්. 34.1

ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට අංක 00390001119: මාතලේ සහ 00390001024: මාතලේ දරන හිමිකම් සහතිකයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම ඔරුන්මා (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය "බන්ධනදායී" ලෙස ද සහ කුරුකුල ජයසූරියලාගේ හසන්ත උදාර ප්‍රේම් පෙරේරා, ජයසූරිය (බන්ධනදායී සමාගමේ අධ්‍යක්ෂක) යන අය "උකස්කරු" ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* - වර්ෂ 2021.05.07 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය*, වර්ෂ 2021.05.06 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ්, තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - දඹුල්ල නගර මධ්‍යයේ සිට ත්‍රිකුණාමලය පාර දෙසට කිලෝමීටර් 8 ක් පමණ ඉනාමළුව හන්දිය ද්වා ගමන් කර 99/2 බෝක්කුව අසලින් දකුණට හැරී සීගිරිය පාර දෙසට කිලෝමීටර් 2.1 ක් ගමන් කරන විට 3/2 බෝක්කුව හමුවේ. ඊට වම් පසින් දේපළ පිහිටා ඇත. (කි.මී. 2 කණුව පසුකර මීටර් 100ක් පමණ දුරින් පිහිටා ඇත.)

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු, එවේලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද, (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද, (සියයට දෙකහමාරක්)
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 500/- ද,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමනාකරු - ණය අයකර ගැනීම්, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667227/0114667220.

එන්. යූ. ජයසූරිය,
උසාවි කොමසාරිස් සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර.
දුරකථන : 0773067360, 0761375993, 0718446374
ෆැක්ස් : 081 2210595

07 - 113

---

**මහජන බැංකුව - ගාල්ල මහවීදිය ශාඛාව (169)**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඇ) වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

01. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, 130B, හාලිවල ග්‍රාම සේවා වසමේ, හාලිවල පිහිටි හිල්සයිඩ් එස්ටේට් නමැති ඉඩමට බෙදූ අංක 54 සහ 55 දරන කැබලි ඒකාබද්ධ කරමින් බලයලත් මිනින්දෝරු ජී. පී. වී. සුනිල් කුසුමසිරි විසින් මැන සාදන ලද 2014.03.29

දිනැති අංක 112/2014 දරන පිඹුර ප්‍රකාර ව බෙදූ අංක 54A55A දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම එකයි හය (පර්. 37.16) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

02. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, 130B, හාලිවල ග්‍රාම සේවා වසමේ, හාලිවල පිහිටි හිල්සයිඩ් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කුසුමන් සිරිවර්ධණ විසින් මැන සාදන ලද 1997.05.26 දිනැති අංක 153/1997 දරන පිඹුර ප්‍රකාර ව බෙදූ අංක 100 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම එකයි තුන (පර්. 13.13)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

03. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, 130B, හාලිවල ග්‍රාම සේවා වසමේ, හාලිවල පිහිටි හිල්සයිඩ් එස්ටේට් නමැති ඉඩම, බෙදූ අංක 42 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු කුසුමන් සිරිවර්ධණ විසින් මැන සාදන ලද 1997.05.24 සහ 25 දිනයන් හි මැන සාදන ලද අංක 153/1997 දරන පිඹුර ප්‍රකාරව බෙදූ $42^{B}$ දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම අටයි එක (පර්. 07.81)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

04. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, 130B, හාලිවල ග්‍රාම සේවා වසමේ, හාලිවල පිහිටි හිල්සයිඩ් එස්ටේට් නමැති ඉඩම, බෙදූ අංක 42 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු කුසුමන් සිරිවර්ධණ විසින් මැන සාදන ලද 1997.05.24 සහ 25 දිනයන් හි මැන සාදන ලද අංක 153/1997 දරන පිඹුර ප්‍රකාර ව බෙදූ අංක $42^{A}$ දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් හය (පර්. 06)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

05. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, 130B, හාලිවල ග්‍රාම සේවා වසමේ, හාලිවල පිහිටි හිල්සයිඩ් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කුසුමන් සිරිවර්ධණගේ 1997.05.26 දින මැන සාදන ලද අංක 153/1997 දරන පිඹුර ප්‍රකාර ව බෙදූ අංක 43 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම හතයි හතර (පර්. 15.74)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

06. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, 130B, හාලිවල ග්‍රාම සේවා වසමේ, හාලිවල පිහිටි හිල්සයිඩ් එස්ටේට් නමැති ඉඩමට, බෙදූ අංක 53 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු කුසුමන් සිරිවර්ධණගේ 1997.05.30, 31 සහ 1998.05.12 දිනැති අංක 190/1997 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම නවයයි බිංදුව (පර්. 22.90)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ, මා විසින් **2023 අගෝස්තු මස 02 වැනි දින පෙ. ව. 11.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා* : 2023.05.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2023.04.28 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසෙන මාර්ගය.* - ගාල්ල සිට අම්බලන්වත්ත කරාපිටිය මාර්ගයේ කි.මී. 2.5 ක් පමණ ගමන් කරන විට හමුවන මිලිද්දුව හන්දියෙන් දකුණට ඇති (හාලිවල පාර) මාර්ගයේ කි. මී. 1.5 ක් පමණ යනවිට වම් පසින් හමුවන ස්ප්‍රින් ෆීල්ඩ් ගාර්ඩින්ස් වෙත ප්‍රවේශවන මාර්ගයේ මීටර් 200ක් පමණ යනවිට දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත. (හොටෙල් හිල් සයිඩ්).

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු, දේශීය විකුණුම් බද්ද 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 2,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (ගාල්ල), අංක 22, පහළ ඩික්සන් පාර, ගාල්ල යන ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 091 2232311, 2223563
ෆැක්ස් අංකය : 091 2231413

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොර ව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන : 011- 2053286/072 3207533
076 9217329.

07 - 116

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

01. ආර්. එම්. සී. ආර්. මැණිකේ / එස්. ජී. ද සිල්වා/
    එස්. කේ. සී. ද සිල්වා
    ගිණුම් අංක : 0056 5001 2773.
02. ශාක්‍ය හෙල්ත් කෙයා මහියංගන ලිමිටඩ්.
    ගිණුම් අංක : 0056 1000 1485.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හාරකෝටි අනූ ලක්ෂ පනස් දහස් නවසිය දහ හතයි ශත පනස් නවයක (රු. 49,050,917.59) මුදල ද, 2020 අගෝස්තු මස 31 වැනි දින සිට අංක 2211, 2405 සහ 2867 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි පනස් හත් ලක්ෂයක (රු. 15,700,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) හා තවත් රුපියල් දෙකෝටි හැත්තෑ ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය හතලිස් හයයි ශත තිහක (රු. 27, 074,146.30) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.10.23 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2023.08.04 වැනි දින පෙ. ව. 11.30** ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැව්ගම්පහ කෝරළේ, බිංතැන්න මහියංගන ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහියංගන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වැව්ගම්පහ ග්‍රාම සේවා කොට්ඨාසය තුළ කුඩුවිල ග්‍රාමයේ පිහිටි සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ. ඩබ්ලිව්. අබේකෝන් විසින් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : සොරබොර වැව පාර සඳහා වෙන් කිරීම, දකුණට : බී. ඒ. විල්සන් විසින් හිමිකම් කියන ඉඩම සහ පොදු ළිඳට දිවෙන පාර සහ බස්නාහිරට : FC 1 ඇළ වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි (රූඩ්. 02) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ වෙළුම/පත්‍රිරුව LDO/Q 18/53 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ඉඩම් කොටස නැවත මනිනු ලැබ ඇති අතර එය පහතින් විස්තර කොට ඇත :

එකී කුඩුවිල ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන ටී. බී. එස්. සංගරන්දෙණිය යන අය විසින් සාදන ලද 1999 මැයි මස 25 දාතම හා අංක 475A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ. ඩබ්ලිව්. අබේකෝන් විසින් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : පාර සඳහා වෙන්කිරීම, දකුණට : අඩි පාර සහ බී. ඒ. විල්සන් විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : කුඹුරු ඇළ අංක 1 සඳහා වෙන්කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි (රූඩ්. 02) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 475A දරන එකී පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

07 - 119

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

අනුජය කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉන්ජිනියර්ස්
ගිණුම් අංක : 0056 1000 0993.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි පන් ලක්ෂ හැට පන් දහස් හාරසිය හැත්තෑ හතයි ශත විසි හයක (රු. 10,565,477.26) මුදලද 2023 පෙබරවාරි 06 වැනි දින සිට අංක 505, 832, 179, 1144, 2179 සහ 2181 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ හතර ලක්ෂ හැට හය දහස් දෙසිය හයයි ශත තුනක (රු. 8,466,206.03) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහක් (11%) හා තවත් රුපියල් දස ලක්ෂ පහළොස් දහස් දෙසිය හැට අටයි ශත අනූ පහක (රු. 1,015,268.95) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.04.28 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.04.19 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි මෙහි **01 වැනි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2023.08.04 වැනි දින පෙ. ව. 09.00 ට සහ 02 වෙනි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2023. 08.04 වැනි දින පෙ. ව. 9.30 ට** පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය නගරය සියනෑ, බිංතැන්න කෝරළේ, මහියංගනය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මහියංගනය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ නව නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රිදීකොටලියගම *නොහොත්* මියුගුණගම පිහිටි "කුරුඹුරුපිටිය" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද 1997 පෙබරවාරි 21 දාතම හා අංක ToPo. PP. 57 අතිරේඛ දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 3568 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: ToPo. PP. 57 හි ලොට් 3239, 3570 සහ 3572, නැගෙනහිරට : ToPo. PP. 57 හි ලොට් 3570, 3572 සහ 3569, දකුණට : ToPo. PP. 57 හි ලොට් 3569 සහ 3567 සහ බස්නාහිරට : ToPo. PP. 57 හි ලොට් 3567, 3239 සහ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි හතරයි හතරයි දෙකක් (0.0442) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක ToPo. PP. 57 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව Q 01/112 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 3568 නැවත මැන ඇති අතර එය පහත විස්තර වේ.

එකී රිදීකොටලියගම *නොහොත්* මියුගුණගම පිහිටි "කුරුඹුරුපිටිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. චන්ද්‍රරත්න යන අය විසින් සාදන ලද 2012 සැප්තැම්බර් 24 දින අංක 2099 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ToPo. P P 57හි ලොට් 3239, 3570 සහ 3572, නැගෙනහිරට : ToPo. P P 57 හි ලොට් 3570, 3572 සහ 3569, දකුණට : ToPo. P P 57 හි ලොට් 3569 සහ 3567 සහ බස්නාහිරට : ToPo. P P 57 හි ලොට් 3567, 3239 සහ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම හතරයි අටක් (P:17.48) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2099 දරන පිඹුරට අනුව ය.

(උකස් බැඳුම්කර 1144, 179 සහ 2179 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

**දෙවන උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බිංතැන්න කෝරළේ, මහියංගනය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ රිදී කොටලියගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රිදීකොටලියගම ග්‍රාමයේ පිහිටි "කුඹුරුපිටියගම *නොහොත්* මියුගුණගම" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද 1997 පෙබරවාරි 21 දාතම හා අංක FVP 57 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 3677 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ලොට් 3674, නැගෙනහිරට : ලොට් 3674, 3676 සහ 3681,

දකුණට : ලොට් 3681 සහ 3678 සහ බස්නාහිරට : ලොට් 3678 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි හතරයි හතරයි එකක් (0.0441) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක FVP 57 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව Q 09/94 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර 2181, 832 සහ 505 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

07 - 120

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව් ඒ. සංජීව
ගිණුම් අංක : 0078 5000 7548

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි දස ලක්ෂ හතලිස් නව දහස් දෙසිය හැට නවයයි ශත දාහතක (රු. 11,049,269.17) මුදල ද, 2023 ජනවාරි 15 දින සිට අංක 3830 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ හතර ලක්ෂ හැට හතර දහස් පන්සිය තිස් දෙකයි ශත අනූ හයක (රු. 8,464,532.96) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) හා තවත් රුපියල් දහ නව ලක්ෂ පනස් අට දහස් හයසිය හැත්තෑ එකයි ශත හැත්තෑ දෙකක (රු. 1,958,671.72) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.04.12 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* 2023.04.12 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2023.09.06 වැනි දින පෙ. ව. 11.30** ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මහරගම නගරය, අංක 530 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගම්මාන පාර දිගේ ඉන් හැරී පන්නිපිටිය පිහිටි ගම්මාන පාර, වරිපනම් අංක 61B දරන "උස් ඉඩම වශයෙන් දැන් හඳුන්වන කොලයින් කුඹුර *නොහොත්* මිගහකුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. ඩී. චන්ද්‍රාණි යන අය විසින් සාදන ලද 2017 අප්‍රේල් 04 දාතම හා අංක 94/2017 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් F වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරටඃ මෙහි ලොට් C සහ E , නැගෙනහිරට : මෙහි ලොට් E සහ ජානක රත්නායකගේ දේපළ, දකුණට : ජානක රත්නායකගේ දේපළ සහ ගම්මාන පාර සහ බස්නාහිරට : ගම්මාන පාර සහ මෙහි ලොට් C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හතරයි බිංදුවක් (P.10.40) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 94/2017 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 438/51 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 94/2017 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් C (අඩි 3 පළල කානුව) සහ ලොට් B (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද ඒ හා බැඳුන වෙනත් අයිතීන් ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

07 - 121

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින් වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ජී. එම්. විජේසිංහ, ජී. එම්. ඩී. කේ. විජේසිංහ සහ ආර්. ඒ. එල්. රණසිංහ

ගිණුම් අංක : 0143 5000 2058

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.10.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් කෝටි හැට පන් ලක්ෂ විසි දහස් හාරසිය දහසයයි ශත හැත්තෑ එකක (රු. 76,520,416.71) මුදල ද, 2020 සැප්තැම්බර් 07 දින සිට අංක 5300, 4490 සහ 4492 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් හය කෝටි අසූ පන් ලක්ෂයක (රු. 68,500,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.01.22 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2021.08.02 දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි

**01 වන උපලේඛනයේ දේපළ හා පරිශ්‍රයන් 2023.08.03 දින පෙ.ව. 11.00 ට,**

**02 වැනි උපලේඛනයේ දේපළ හා පරිශ්‍රයන් 2023.08.03 දින පෙ.ව. 11.15 ට,**

**03 වැනි උපලේඛනයේ දේපල හා පරිශ්‍රයන් 2023.08.03 දින පෙ. ව. 11.30 ට,**

**04 වැනි උපලේඛනයේ දේපළ හා පරිශ්‍රයන් 2023.08.03 වැනි දින පෙ.ව. 11.45 ට** පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කමරවන්නි පළාතේ පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තම්මැන්නාගම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. මරියදාස් යන අය විසින් සාදන ලද 2018 මාර්තු මස 18 දාතම හා අංක 3284 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : රණසිංහ ලතාගේ ඉඩම සහ මංචනායක ගේ ඉඩම, නැගෙනහිරට : පාර (මා සං අ) සහ එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, දකුණට : එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, සේනානායක ගේ ඉඩම සහ විජේසිංහ ගේ ඉඩම, බස්නාහිරට : විජේසිංහ ගේ ඉඩම සහ රණසිංහ ලලිතා ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අක්. 02) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 3284 දරන එකී පිඹුරට අනුවය.

අංක 3284 පිඹුරේ නිරූපිත ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තම්මැන්නාගම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. තංගවඩිවේලු යන අය විසින් සාදන ලද 2003 මාර්තු මස 11 දාතම හා අංක 2616 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රණසිංහ ආරච්චිගේ ලලිතාගේ ඉඩම සහ මංචනායක ගේ ඉඩම, නැගෙනහිරට : අඩි පාර සහ එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, දකුණට : එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, සේනානායක ගේ ඉඩම, බස්නාහිරට : විජේසිංහ ගේ ඉඩම සහ රණසිංහ ලලිතා ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අක්. 02) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2616 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව J/Ana 31/09 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කමරවන්නි පළාතේ පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව (පළු) ග්‍රාමයේ පිහිටි "තෙන්නන්කුරියාව මූකලාන" යයි කියනු ලබන ඉඩමට බලයත් මානක තැන ජේ. ඒ. වී. රාජනායගම් විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 09 දාතම හා අංක 3241 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලලිතාගේ ඉඩම, නැගෙනහිරට : ලලිතා ගේ ඉඩම සහ පාර, දකුණට : පාර සහ ලලිතා ගේ ඉඩම, බස්නාහිරට : ලලිතාගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් විසි දෙකයි දශම තුනයි හයක් (අක්. 02, රූ. 01, පර්. 22.36) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 3241 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO/320/50 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 5300 මගින් හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.)

3. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කමරවන්නි පළාතේ, පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සහා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තෙන්නන්කුරියාව කැලේ, පලුගහහේන. තන්නන්කුරියහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. මරියදාස් යන අය විසින් සාදන ලද 2017 මාර්තු මස 03 දතම හා අංක 2879 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ජී. එම්. විජේසිංහ ගේ ඉඩම, නැගෙනහිරට : ආඬිගම සිට ගල්ගමුව දක්වා පාර (මා සං අ), දකුණට : ඩී. එම්. බේබි නෝනා ගේ ඉඩම, බස්නාහිරට : ජී. එම්. විජේසිංහගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හයයි නමයක් (පර්.12.69) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2879 දරන එකී පිඹුරට අනුව ය.

අංක 2879 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1, බලයලත් මානක තැන වී. විග්නේශ්වරන් විසින් සාදන ලද 2009 ජූලි මස 18 දාතම හා අංක 4327 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි නැවත මිනුමක් වන අතර, තවත් අයුරකින් පහත සඳහන් ඉඩමේ නැවත මිනුමක් ද වේ :

එකී තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තෙන්නන්කුරියාව කැලේ, පලුගහහේන, තන්තන්කුරියහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. තංගවඩිවේලු යන අය විසින් සාදන ලද 1998 නොවැම්බර් මස 17 දාතම හා අංක 510 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ජී. එම්. විජේසිංහ ගේ ඉඩම, නැගෙනහිරට : ආඬිගම සිට ගල්ගමුව දක්වා පාර (මා සං අ), දකුණට : ඩී. එම්. බේබි නෝනා ගේ ඉඩම, බස්නාහිරට : ජී. එම්. විජේසිංහගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හයයි නමයයි තුනක් (පර්. 12.693) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 510 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව S 59/248 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4490 මගින් හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.)

4. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ. කුමාරවන්නි පළාතේ, පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ආනමඩුව අංක 656A ග්‍රාම නිලධාරි වසම තුළ ආනමඩුව - පෙට්ටිකුලම ග්‍රාමයේ පිහිටි "පෙට්ටිකුලම කැලේ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. ගුහනන්දන් විසින් සාදන ලද 2003 පෙබරවාරි මස 09 දාතම හා අංක 1218 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1, 2, 3 සහ 4 වශයෙන් ලකුණු කොට ඇති ඒකාබද්ධ ඉඩම් කොටස්වලට මායිම් : උතුරට : එච්. එම්. උක්කුබණ්ඩා ගේ ඉඩම, නැගෙනහිරට : කේ. එච්. එම්. දිසානායකගේ ඉඩම, දකුණට : ඩබ්ලිව්. එම්. හේරත් බණ්ඩා ගේ ඉඩම, බස්නාහිරට : ආඬිගම සිට නවගත්තේගම දක්වා පාර (මා. සං. අ) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (රූ. 02) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්‍රිරුව J 08/82 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 4492 මගින් හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි.

සමාගම් ලේකම්.

07 - 122/1

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

01. කෞෂල්‍යා ව්‍යාපාර සමූහය.
ගිණුම් අංක : 0143 1000 0028.

02. ජී. එම්. විජේසිංහ, ජී. එම්. ඩී. කේ. විජේසිංහ සහ ආර්. ඒ. එල්. රණසිංහ.
ගිණුම් අංක : 3143 6500 0095/0143 5000 2038.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2020.10.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි දහ අට ලක්ෂ එක් දහස් දෙසිය හතළිස් දෙකයි ශත හතළිස් හතරක (රු. 11,801,242.44) මුදල ද 2020 සැප්තැම්බර් 07 වැනි දින සිට අංක 5298 සහ 5632 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතළිස් ලක්ෂයක (රු. 4,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොළිය ද හා තවත් රුපියල් පනස් තුන් ලක්ෂ පනස් දහසක (රු. 5,350,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වියදම් වෙනත් ගාසතු, තදනන්තරව

දරන්නට සිදු වූ යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2021.01.22 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2021.08.02 දින "දිවයින", සහ "තිනක්කුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි **2023.08.03 දින ප.ව. 12.00** ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කුමාරවන්නි පළාතේ පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව (පළු) ග්‍රාමයේ පිහිටි "තෙන්නන්කුරියාව මූකලාන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. තන්ගවඩිවේලු යන අය විසින් සාදන ලද 2002 මාර්තු මස 13 දතම හා අංක 2112 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : සමිත මංචනායක සහ දිනේෂ් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : දිනේෂ් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර, දකුණට : පාර සහ විමල් පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : විමල් පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් පහළවක් (අක්. 02, රූ. 03, පර්. 15) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2112 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව LDO 153/198 යටතේ පුත්තලම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07 - 122/2

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

යූ. ජී. ඒ. ප්‍රනාන්දු.
ගිණුම් අංක : 1001 5045 0505.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහ හතර කෝටි තිස් පන් ලක්ෂ තිස් පන්දහස් හාරසිය තිස් හයයි ශත එකක (රු. 143,535,436.01) මුදල ද, 2023 පෙබරවාරි 10 වැනි දින සිට අංක 3595, 3597, 5561, 5563, 4258, 4658, 884 A, 985 සහ 3762 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දොළොස් කෝටි විසි හතර ලක්ෂ එකොළොස් දහස් පන්සිය පහළවයි ශත දහ නමයක (රු. 122,411,515.19) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක (10%) හා තවත් රුපියල් එක්කෝටි දහ නම ලක්ෂ හතළිස් පන් දහස් හයසිය අසූ එකයි ශත හතළිස් හයක (රු. 11,945,681.46) මුදලක් සඳහා පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් වියදම් ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනවල සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.03.31 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2023.03.17 දින "දිවයින", "තිනක්කුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2023.09.07 දින ප.ව. 4.00 ට පළමු උපලේඛණයේ දේපල හා ප.ව. 3.30 ට දෙවන උපලේඛණයේ** දේපල පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කොල්ලුපිටිය ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ සහ කොල්ලුපිටිය, වෝඩ් අංක 37 (ගාලු පාර), කොල්ලුපිටිය පාරේ පිහිටි "ද මොනාක් ඇට් ක්‍රිස්කැට් සිටි" වශයෙන් හඳුන්වනු ලබන සහාධිපත්‍ය දේපළෙ හි දහ හත් වෙනි මහලේ (17 වැනි) පිහිටි වරිපනම් අංක 89 - 17/7 දරන බලයලත් මානක තැන ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද 2008 පෙබරවාරි 26 දාතම හා අංක 6562 දරන සහාධිපත්‍ය පිඹුරේ අංක Y/F17/U3 වශයෙන් ලකුණු කොට ඇති සහාධිපත්‍ය කැබැල්ලට මායිම් :

*උතුරට* : කැබලි Y/F5/U/3 (ඉහත මුහුණත) Y/F17/U4,

*නැගෙනහිරට* : කැබලි Y/F17/U4 මායිම් ව සහ CE/F17/10,

*දකුණට* : CE/F17/10 සහ කැබලි Y/F17/U2,

*බස්නාහිරට* : කැබලි Y/F17/U2 සහ Y/F5/U2 (ඉහත මුහණත),

*ඉහළ අහස් මුදුන* ZENITH (Top) : කැබලි Y/F18/U3 සහ,

*යට අහස් මුදුන* NADIR (Bottom) : කැබලි Y/F16/U3

ප්‍රමාණයෙන් වර්ග මීටර් අසූ තුනක (83sq.m.) බිමක් අඩංගු ඉහත දෑ, එකී අංක 6562 පිඹුර ප්‍රකාර, වෙළුම/පත්‍රිකාව CON E 110/119 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නිසිලෙස ලියාපදිංචි කොට ඇත.

ප්‍රමාණයෙන් වර්ග මීටර් අසූ තුනක් (83sq.m.) අඩංගු බිම් කොටස.

මෙම සහාධිපත්‍ය දේපළෙ හි පොදු අංගෝපාංගයන් හි මෙම සහාධිපත්‍ය කැබැල්ලේ නොබෙදූ කොටස් අගය 22%කි.

මෙම සහාධිපත්‍ය කැබැල්ලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙස CE/F17/10 වේ.

පහත සීමාවන් තුළ පිහිටි A 149 (වාහන නවතා තැබීමේ අංගනය) වශයෙන් ලකුණු කොට ඇති පිවිසුම් කැබැල්ල ද සමග ය :

*උතුරට* : Y/B, FO, F1/U1/A5,
*නැගෙනහිරට* : A148 උපාංග කැබැල්ල,
*දකුණට* : CE/FO/1,
*බස්නාහිරට* : CE/FO/1,
*ඉහළ අහස් මුදුන* ZENITH (Top) : මෙම කැබැල්ලේ ඉහළ මුහුණත,

සහ

*යට අහස් මුදුන* NADIR (Bottom) : මෙම කැබැල්ලේ කොන්ක්‍රීට් පොළව.

ප්‍රමාණයෙන් වර්ග මීටර් දොළහක් (12sq.m.) අඩංගු බිම් කොටස.

බලයලත් මානක තැන එච්. ආර්. සමරසිංහ විසින් සාදන ලද 1995 නොවැම්බර් 16 දාතම හා අංක 2289 දරන පිඹුරේ නිරූපිත ලොට් 7 මතින් ඒ දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

එකී අංක 6562 සහාධිපත්‍ය පිඹුරේ මැනවින් විස්තර කොට ඇති පොදු අංගෝපාංග සහ එපාර්ට්මන්ට් හිමිකම් නීතිය ප්‍රකාරව, සහාධිපත්‍ය දේපළෙහි ව්‍යවස්ථාපිත සියලු පොදු අංගෝපාංගයන් භාවිතා කිරීමේ හා භුක්ති විඳීමේ අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 3595, 3597 සහ 5563 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ කොළඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කොළඹ ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ, කොළඹ 02, සුදුවැල්ල වෝඩ් අංක 24 හයිඩ් පාර්ක් කෝනර් හි පිහිටි ආලින්ද කාමරය, කෑම කාමරය, නිදන කාමර තුනක්, පැන්ට්‍රිය, ගබඩා කාමරය, වැසිකිලි තුනක්, ඩ්‍රයිං යාර්ඩ්, යනාදියෙන් සමන්විත කොළඹ 02, හයිඩ් පාර්ක් කෝනර්, අංක 79 - 5/4, දරන බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003 ජනවාරි 04 දාතම හා අංක 1352 දරන සහාධිපත්‍ය පිඹුරේ අංක 01A/F5/U8 (පස්වෙනි මහලේ) වශයෙන් ලකුණු කොට ඇති එපාර්ට්මන්ට් ඒකකයට මායිම් :

*උතුරට* : පොදු අංගෝපාංග 1CE7 වලින් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තිය සහ 1A/F5/U7 වෙතින් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තියේ මැද,
*නැගෙනහිරට* : පොදු අංගෝපාංග 1CE1 ඉහළ ඉඩෙන් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තිය,
*දකුණට* : පොදු අංගෝපාංග 1CE4 වෙතින් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තිය, ඒකක 1A/F5/U1 වෙතින් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තියේ මැද, සහ පොදු අංගෝපාංග 1CE14 වෙතින් මෙම ඒකකය වෙන්කෙරෙන බිත්තිය,
*බස්නාහිරට* : පොදු අංගෝපාංග 1CE14 ඉහළ ඉඩෙන් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තිය, ඒකක 1A/F5/U7 න් මෙම ඒකකය වෙන් කෙරන බිත්තියේ මැද,
*ඉහළ අහස් මුදුන* : ZENITH (Top) 1A/F6/U8 ඒකකය වෙතින් මෙම ඒකකය වෙන් කෙරෙන කොන්ක්‍රීට් ස්ලැබ් කොටසේ මැද,

සහ

*යට අහස් මුදුන* NADIR (Bottom) : 1A/F6/U8 ඒකකය වෙතින් මෙම ඒකකය වෙන් කෙරෙන කොන්ක්‍රීට් ස්ලැබ් කොටසේ මැද,

ප්‍රමාණයෙන් වර්ග මීටර් 160.627sq.m. (1728.975 Sq. Feet) ක බිම් ප්‍රමාණය,

මෙම සහාධිපත්‍ය දේපළෙහි පොදු අංගෝපාංගයන් හි මෙම සහාධිපත්‍ය කැබැල්ලේ නොබෙදූ කොටස් අගය 1.047% කි.

මෙම ඒකකයට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙස 1CE14 වේ.

මෙම ඒකකය ලොට් 1හි උපබෙදුම් කළ A ගොඩනැගිල්ලෙ හි ඒකකයකි. උපාංග ඒකක 1A/F2/U4/A52 සමග කැබලි කොට වෙන් කිරීමට නියමිත ය.

CON D 89/130 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

**පොදු අංගෝපාංග**

1982 අංක 45 දරන පනතේ (සංශෝධිත) 12 වැනි වගන්තිය මගින් සංශෝධිත 1973 අංක 11 දරන එපාර්ට්මන්ට් හිමිකම් නීතියේ 26 වැනි වගන්තිය ප්‍රකාර සහාධිපත්‍ය දේපළෙහි ව්‍යවස්ථාපිත පොදු අංගෝපාංගයන්.

a) සහාධිපත්‍ය දේපළට අනුබද්ධ විවෘත ඉඩකඩ ද ඇතුළුව, ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම.

b) ගොඩනැගිල්ලේ අත්තිවාරම්, කණු, කුළුණු, බාල්ක, යට ලී, මුක්කු, ප්‍රධාන බිත්ති සහ වහල ටොප් ටෙරසයන්.

c) පොම්ප, මුදුනෙහි වූ උඩින් පිහිටි ටැංකි, ජල සම්ප් වලවල්, ජල පයිප්ප, ජල සම්පාදන, ඉන්ධනන ගබඩා ටැංකි, අවශ්‍ය විට දී භාවිතයට සූදානම්කොට ඇති විදුලි ජනන යන්ත්‍රය සමග විදුලිය වැනි මධ්‍ය සේවාවන් සඳහා ස්ථාපිත කිරීම්.

පයිප්ප, මැන්හෝල් වලවල්, සම්ප් වලවල්, පයිප්ප අඩංගු මළාපවහන සහ අපද්‍රව්‍ය ජල බැහැර කිරීම් පද්ධතිය.

අනතුරු සංඥා පද්ධතිය සහ ගිනි නිවන උපකරණ, නිවාස, බීරළු, ගිනි නිවන පොම්ප, දුම් අනාවරකයන් අඩංගු ගිනි ආරක්ෂක හා අනාවරක පද්ධතිය.

විදුලි සෝපාන දෙකක් අඩංගු සිරස් ප්‍රවාහන පද්ධතිය. එක්සිපෙලර් පංකා සහ එක්ස්හෝස්ට් ඩක්ට් සහ වාතාශ්‍රයන්ගෙන් සමන්විත වාතාශ්‍ර පද්ධතිය.

හෙඩ් එන්ඩ් උපකරණ සහ ඇම්ප්ලිෆයර් සංදාම අඩංගු MATV පද්ධතිය.

අනතුරු සංඥා පද්ධතිය සහ අධීක්ෂණ පද්ධතිය, CCTV කැමරා අඩංගු ආරක්ෂක අනතුරු සංඥා පද්ධතිය.

කුණු කසල ප්‍රවාහනය සඳහා ඩම්ප් වේටර් අඩංගු කැලි කසළ බැහැර කිරීමේ පද්ධතිය.

d) සාමාන්‍යයෙන් පොදු භාවිතය හෝ නඩත්තු ආරක්ෂාව සහ එහි පැවැත්මට පහසු හෝ අවශ්‍යවන දේපළෙහි පහසුකම් සහ අනෙකුත් සියලුම කොටස්.

පිඹුරුපත් පිටු හී විස්තර කොට ඇති සහ රූප රේඛණය කොට ඇති ප්‍රදේශ පොදු අංගෝපාංගයන් හි නිර්වචනය සහ විස්තර කිරීම.

1CE1 (A) මෙය ගොඩනැගිල්ලට පිවිසුම් මාර්ගය සහ ගොඩනැගිල්ල වටා විවෘත ඉඩකඩ සහ ඉඩම වේ.

(B) වාතාශ්‍රය සඳහා විවෘත ඉඩකඩ

(C) සියලුම ඒකකයන් හී පොදු භාවිතය සඳහා පිවිසුම් මාර්ගය සහ ඉඩම

(D) ගොඩනැගිලි ඒකකයන් හි බාහිර පෙදෙස් හි සේවා ඩක්ට්

1CE2 පළමු මහලේ සිට එකොළොස්වෙනි මහල දක්වා වායු සමන අංගෝපාංගයන් තැබීම සඳහා විවෘත පෙදෙස වේ.

1CE3 පළමු මහලේ සිට එකොළොස්වෙනි මහල දක්වා වායු සමන අංගෝපාංගයන් තැබීම සඳහා විවෘත පෙදෙස වේ.

1CE4 පළමු මහලේ සිට එකොළොස්වෙනි මහල දක්වා වායු සමන අංගෝපාංගයන් තැබීම සඳහා විවෘත පෙදෙස වේ.

1CE5 පළමු මහලේ සිට එකොළොස්වෙනි මහල දක්වා වායු සමන අංගෝපාංගයන් තැබීම සඳහා විවෘත පෙදෙස වේ.

1CE6 කාර්මික සහ ජලනල ඩක්ට් වන අතර පොදුවේ භාවිතා කිරීම සඳහා වේ.

1CE7 කාර්මික සහ ජලනල ඩක්ට් වන අතර පොදුවේ භාවිතා කිරීම සඳහා වේ.

1CE9 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට්, ලවුන්ජ් ලොබිය, ආරක්ෂක කාමරය, ට්‍රාන්ස්ෆෝමර කාමරය, CEB මනු කාමරය, විදුලි පැනල් කාමරය, පිළිගැනීමේ නිලධාරි පෙදෙස, ගෑස් සිලින්ඩර් ගබඩාව සහ වාහන පදවාගෙන යාමේ මාර්ගය වේ. මෙම පෙදෙස බිම් මහලේ වන අතර, පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE10 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැලිකසල කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට්, ලවුන්ජ් ලොබිය, ආරක්ෂක කාමරය, ට්‍රාන්ස්ෆෝමර කාමරය, CEB මනු කාමරය, විදුලි පැනල් කාමරය, පිළිගැනීමේ නිලධාරි පෙදෙස, ගෑස් සිලින්ඩර් ගබඩාව සහ වාහන පදවාගෙන යාමේ මාර්ගය වේ. මෙම පෙදෙස පළමු මහලේ වන අතර, පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE11 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැලිකසල කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස දෙවන මහලේ වන අතර, පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE12 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස තෙවන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE13 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස සිව්වන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE14 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස පස්වන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE15 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස සයවන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE16 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස සත්වන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE17 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස අටවන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE18 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස නවවන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE19 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස දසවන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE20 මෙය පැසේජය, ජැනිටර් කාමරය, සෝපාන සේවාව, ඩක්ට්, කැළිකසළ කාමරය, ගිනි නිවන උපකරණ, කැබිනෙට්ටුව, අඩු ධාරිතා වෝල්ටේජ් ඩක්ට් සහ වායු පීඩන ඩක්ට්, විවෘත පෙදෙස වේ. මෙම පෙදෙස එකොළොස්වන මහලේ වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE21 මෙය විදුලි ජනන යන්ත්‍ර කාමරය, මෝටර් කාමරය, කුලිං කුළුන, සේවා පෙදෙස, ගබඩා, තරප්පු පෙළ, රූෆ් ටොප් හි විවෘත පෙදෙස, වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE22 මෙය පහත බිම් මහලේ දුම් බොන ලොබිය, සෝපාන ගිනි නිවන පෙදෙස, සෝපාන සේවා, විදුලි ඩක්ට්, වාහන පැදවීමේ මාර්ගය, පොම්පාගාර කාමරය, සම්ප් වලවල්, ආරක්ෂක කාමරය, ජැනිටර් කාමරය සහ වැසිකිළි වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

1CE23 මෙය මැසනයින් මහලේ දුම් බොන ලොබිය, සෝපාන ගිනි නිවන පෙදෙස, සෝපාන සේවා, විදුලි ඩක්ට්, වාහන පැදවීමේ මාර්ගය, පොම්පාගාර කාමරය, සම්ප් වලවල්, ආරක්ෂක කාමරය, ජැනිටර් කාමරය, ස්ටීම් බාත්, පිහිනුම් තටාකය, භෝජනාගාරය, ගබඩා, පැන්ට්‍රිය සහ වැසිකිළි වන අතර පොදුවේ භාවිතා කරනු ලැබීම සඳහා වේ.

පොදු අංගෝපාංගයන් සහ උපාංග ඒකක සමග 1A/F5/U8 වශයෙන් ලකුණුකොට ඇති එකී සහාධිපත්‍ය ඒකකය මෙම ගොඩනැගිල්ලේ පිහිටා ඇති අතර පහත සඳහන් ඉඩම් කැබලි වල පිහිටා ඇත :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ කොළඹ 02, (සුදුවැල්ල) වෝඩ් අංක 34, හයිඩ් පාර්ක් කෝනර් හි පිහිටි හයිඩ් පාර්ක් කෝනර් වරිපනම් අංක 79B1, 79M1, 79, 791/1 සිට 79 1/8 ට 79 2/1 සිට 79 2/8ට, 79 3/1 සිට 79 3/8ට, 79 4/1 සිට 79 4/8ට, 79 5/1 සිට 79 5/8ට 79 6/1 සිට 79 6/8ට, 79 7/1 සිට 79 7/8ට, 79 8/1 සිට 79 8/8ට, 79 9/1 සිට 79 9/8ට, 79 10/1 සිට 79 10/8ට, 79 11/1 සිට 79 11/8ට දරන "වික්ටෝරියා මිල්ස්" යනුවෙන් කළින් හැඳින්වූ "හයිඩ් පාර්ක්

රෙසිඩන්සීස්" යයි කියනු ලබන (මෙහි 1999 දෙසැම්බර් 12 දාතම හා අංක 1228 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 සහ 2 යනුවෙන් ලකුණු කොට ඇති යාබද ඉඩම් කොටසේ ඒකාබද්ධයක් වන) බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2005 ජනවාරි 04 දාතම හා අංක 1352 දරන බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන වෝල්ටර් ද සිල්වා විසින් සාදන ලද 1993 ඔක්තෝබර් මස 10 දාතම හා අංක 700 දරන පිඹුරේ ලොට් D3 සහ D2, නැගෙනහිරට : අංක 700 දරන එකී පිඹුරේ ලොට් D2, දකුණට: එකී අංක 1228 දරන පිඹුරේ ලොට් 3 සහ ධර්මපාල මාවත, වරිපනම් අංක 185/2 A දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : හයිඩ් පාර්ක් කෝනර් සහ අංක 1228 දරන එකී පිඹුරේ ලොට් 3හි පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් විසි පහයි දශම දෙකයි පහක් (රූඩ්. 03, පර්. 25.25) හෝ හෙක්ටයාර 0.35473 වන ඉඩම් කොටස පහත බිම් මහල, බිම් මහල, මැසනයින් බිම් මහල සහ වෙනත් මහල් එකොළහකින් සමන්විත දොළොස් මහල් ගොඩනැගිල්ල සහ එහි පිහිටි සෑම සියලු දේ එකී පිඹුරු අංක 1352 යටතේ හිමිකම් CON A 105/77 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහත ඉඩම්වල ඒකාබද්ධයක් වේ.

1. එකී කොළඹ 02, (සුදුවැල්ල) වෝඩ් අංක 34, හයිඩ් පාර්ක් කෝනර් හි පිහිටි "වික්ටෝරියා මිල්ස්" යනුවෙන් කළින් හැඳින්වූ "රිචඩ් පීරිස් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ්" යයි කියනු ලබන බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 1999 දෙසැම්බර් මස 12 දාතම හා අංක 1228 දරන බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 700 දරන එකී පිඹුරේ ලොට් D 3 (පිවිසුම් මාර්ගයක් සඳහා වෙන්කිරීම), නැගෙනහිරට : අංක 1228 දරන එකී පිඹුරේ ලොට් 2, දකුණට : එකී අංක 1228 දරන පිඹුරේ ලොට් 3 සහ බස්නාහිරට : හයිඩ් පාර්ක් කෝනර් හි පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් දෙකයි දශම නමයයි හයක් (පර්. 32.96) හෝ හෙක්ටයාර 0.08336 වන ඉඩම් කොටස සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී පිඹුරු අංක 1228 යටතේ 972/154 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී කොළඹ 02, (සුදුවැල්ල) වෝඩ් අංක 24, හයිඩ් පාර්ක් කෝනර් හි පිහිටි "වික්ටෝරියා මිල්ස්" යනුවෙන් කළින් හැඳින්වූ "රිචඩ් පීරිස් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ්" යයි කියනු ලබන බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 1999 දෙසැම්බර් 12 දාතම හා අංක 1228 දරන බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 700 දරන එකී පිඹුරේ ලොට් D 3 සහ D 2, නැගෙනහිරට : අංක 700 දරන එකී පිඹුරේ ලොට් D 2, දකුණට : එකී අංක 1228 දරන එකී පිඹුරේ ලොට් 3 සහ ධර්මපාල මාවත, වරිපනම් අංක 185/2A දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : එකී අංක 1228 දරන එකී පිඹුරේ ලොට් 1 සහ ලොට් 3 හි පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසි හතයි දශම දෙකයි නමයක් (රූ. 2, පර්. 27.29) හෝ හෙක්ටයාර 0.027137 වන ඉඩම් කොටස සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී පිඹුරු අංක 1228 යටතේ 972/155 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(අංක 884 A, 985, 3762, 4258, 4658 සහ 5561 යන උකස් බැඳුම්කර මගින් හා ඒවා යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07 - 123/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ඇන්ඩ් ඩී. ප්ලාස්ටික් ඇන්ඩ් පොලිම කම්පැණි.
ගිණුම් අංක : 0155 1000 0320.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහ අට කෝටි දහ අට ලක්ෂ පනස් හතර දහස් දහසයයි ශත තිස් එකක (රු. 181,854,016.31) මුදලක් 2023 ජනවාරි මස 14 වැනි දින සිට එකී අංක 1371, 3642, 1373, 2638 හිමිකම් සහතිකපත් අංක 00042536198 හි 2016 අගෝස්තු මස 09 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය, 2017 පෙබරවාරි මස 27 දිනැති දෙවන උකස් බැඳුම්කරය, 2017 ජූලි 27 දිනැති තෙවන උකස් බැඳුම්කරය, 2018 ඔක්තෝබර් මස 11 දිනැති සිව්වන උකස් බැඳුම්කරය සහ 2018 ඔක්තෝබර් මස 11 දිනැති පස්වන උකස් බැඳුම්කරය සහ අංක MMB/SBL/155/2018/01 සහ MMB/SBL/155/2018/02 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කර ප්‍රකාර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකොළොස් කෝටි පනස් හත් ලක්ෂ තිස් එක් දහස් පන්සිය අසූ තුනයි ශත අනූ එකක (රු. 115,731,583.91) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Three Per centum (ARPLR

+ 3%) per annum with foor rate of Eight per centum (8%) per annum බැගින් වූ පොළිය ද, හාතවත් රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක් (රු. 25,000,000.00) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Three Per centum (ARPLR + 3%) per annum with foor rate of Eight per centum (8%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.03.31 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.03.17 දින "දිවයින", "තිනක්කුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි

**2023.08.02 දින පෙ.ව. 10.30 ට** Plan No. 606

**2023.08.02 දින ප.ව. 1.00 ට** Plan No. 2005/122

**2023.08.02 දින පෙ.ව. 11.00 ට** Caderstral map No. 520202

**2023.08.02 දින පෙ.ව. 11.30 ට** Machineries

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඉදිබැද්ද නැගෙනහිර අංක 559 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ඉදිබැද්ද පිහිටි යැච් ක්ලබ් පාර, වරිපනම් අංක 03 දරන "මුන්හේන්තුඩුවේ ගොරකගහලන්ද" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ජී. ඩී. අර්සකුලරත්න යන අය විසින් සාදන ලද 2007 ජූලි මස 31 දාතම හා අංක 606 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එල්. පී. එච්. ද සිල්වාගේ දේපළ, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 2, දකුණට : ලොට් 3 පාර, අඩි 10 පළල සහ බස්නාහිරට: යැච් ක්ලබ් පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයක් (පර්. 16) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 606 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී ඉදිබැද්ද පිහිටි "මුන්හේන්තුඩුවේ ගොරකගහලන්ද" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. පී. එච්. ද සිල්වා යන අය විසින් සාදන ලද 1990 ඔක්තෝබර් මස 27 දාතම හා අංක 2087 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එස්. පී. ද සිල්වාගේ දේපළ, නැගෙනහිරට : මෙහි ලොට් 2, දකුණට : ලොට් 3 පාර අඩි 10 පළල සහ බස්නාහිරට : යැච් ක්ලබ් පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයක් (පර්. 16) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2087 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 264/18 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1371 සහ 3642 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඉදිබැද්ද නැගෙනහිර අංක 559 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කටුබැද්ද ජොන් රුද්‍රිගු මාවත පිහිටි ජොන් රුද්‍රිගු මාවත, වරිපනම් අංක 33/1/1 දරන "අලුබෝගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. එස්. බමුණුසිංහ යන අය විසින් සාදන ලද 2005 ජූනි මස 01 දාතම හා අංක 2005/122 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන වයි. කරුණාරත්න කොස්තා යන අය විසින් සාදන ලද අංක 554 දරන පිඹුරේ ලොට් 5 සහ 14, නැගෙනහිරට : ජොන් රුද්‍රිගු මාවත, දකුණට : අංක 687 දරන පිඹුරේ ලොට් 6A සහ බස්නාහිරට : බලයලත් මානක තැන වයි. කරුණාරත්න කොස්තා යන අය විසින් සාදන ලද අංක 554 දරන පිඹුරේ ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2005/122 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 211/50 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1373 සහ 2638 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඉදිබැද්ද නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ඉදිබැද්ද පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද කැඩැස්තර් සිතියම් අංක 520203 හි බ්ලොක් අංක 03හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට පාර්සල් 0110 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර්සල් 108, 109, 115 සහ 117, නැගෙනහිරට : පාර්සල් 119 සහ 223, දකුණට : පාර්සල් 226, 225 සහ 305 සහ බස්නාහිරට : සුධර්මරත්නාරාම (පාර්සල් 306) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම එකයි පහයි හතරයි අටක් (හෙක්. 0.1548) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී කැඩැස්තර සිතියම් අංක 5202203ට අනුව සහ හිමිකම් සහතිකපත් අංක 000425361198හි දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදංචි කොට ඇත.

(හිමිකම් සහතිකපත් අංක 00042536198 හි 2016 අගෝස්තු මස 09 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය, 2017 පෙබරවාරි මස 27 දිනැති දෙවන උකස් බැඳුම්කරය, 2017 ජූලි 27 දිනැති තෙවන උකස් බැඳුම්කරය, 2018 ඔක්තෝබර් මස 11 දිනැති සිව්වන උකස් බැඳුම්කරය සහ 2018 ඔක්තෝබර් මස 11 දිනැති පස්වන උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

### දෙවන උපලේඛනය

1. මෙහි පහතින් මැනවින් විස්තර කොට ඇති මොරටුව, විල්ලෝරවත්ත, දීපානන්ද පාර, අංක 80/3හි පරිශ්‍රයන් හා ඒවා මත තබනු ලබන සහ වෙනත් ස්ථානයක/කින් හෝ ස්ථානවල/ලින් මේවා ඉවත් කොට ගෙන යනු ලබන සහ ගබඩාකොට තබා ඇති හෝ ස්ථාපිත කොට ඇති සියලු හා එක් එක් චංචල යන්ත්‍රාගාර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ.

| *No.* | *Description* |
|---|---|
| 1. | Biodegradable/ LDPE/HDPE film blowing Machine Model – SJ – B65 |
| 2. | LLDP/ LDPE/ HDPE/ high speed Film Blowing Machine Model – SJ – B60 |
| 3. | Fully Automatic Bag making Machine Model – SHXJ – C800 |
| 4. | Computer heat scaling and cold cutting bag machine<br>Model – GFQ – 1000 |
| 5. | Pneumatic Punching Machine (12 Tons) |
| 6. | Polythene Mixer 1000 Kg |
| 7. | Plastic Grind Machine – 350 Kg/h |
| 8. | Double Film Winder – 1000 mm width |
| 9. | Strand water cooling recycling Machine C 160 |
| 10. | Strand water cooling recycling Machine C 140 Model – TS – C140 |
| 11. | Agglomerates<br>Model – 400 L |

එමෙන්ම එකී පරිශ්‍රයන් හි ස්ථාපිත කරනු ලබන සහ ඒවා වෙත ගෙන එනු ලබන සහ එකී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ වෙනුවට කලින් කලට ගෙනෙනු ලබන චංචල යන්ත්‍රසූත්‍ර හෝ මේවායේ ඕනෑම උපාංගයක් හෝ කොටසක්

(යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කර අංක MMB/SBL/155/2018/01 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

2. මෙහි පහතින් මැනවින් විස්තර කොට ඇති මොරටුව, විල්ලෝරවත්ත, දීපානන්ද පාර, අංක 80/3හි පරිශ්‍රයන් හා ඒවා මත තබනු ලබන සහ වෙනත් ස්ථානයක/කින් හෝ ස්ථානවල/ලින් මේවා ඉවත්කොට ගෙන යනු ලබන සහ ගබඩාකොට තබා ඇති හෝ ස්ථාපිත කොට ඇති සියලු හා එක් එක් චංචල යන්ත්‍රාගාර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ.

| *Item No.* | *Description of Machine* |
|---|---|
| 1. | Sawdust Dryer including 3mm screw drum electrical, Blower with 50 HP motor Y5 – 47 and machine No. 1500-27-600, saw dust hopper, hot air furnace with furnace bricks insulation, 06 Nos. Drying Channels or Cylinders, Discharging screw conveyor with 20 HP motor, control panels.<br><br>Identification No. : 2991-2016 |

(යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කර අංක MMB/SBL/155/2018/02 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

07 - 123/2

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

1. කේ. ඒ. ටී. තරංග ඇන්ඩ් එස්. වී. ජී. එම්. සුරංජි
 ගිණුම් අංක : 1151 5711 8680.
2. කෙසෙල්වත්ත මල්ටි ට්‍රේඩිං කම්පැණි
 ගිණුම් අංක : 0151 1000 0771
3. කැට් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
 ගිණුම් අංක : 0151 1000 0860

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හාර කෝටි දොළොස් ලක්ෂ විසි හත් දහස් හයසිය පනස් නමයයි ශත හැත්තෑ එකක (රු. 41,227,659.71) මුදල ද, 2023 ජනවාරි මස 19 දින සිට අංක 3570, 5431, 5429, 5533, 3400, 5531, 1359, 1891 සහ 936 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි හතලිස්පන් ලක්ෂ අනූ හත් දහස් හයසිය හැත්තෑ එකයි ශත අසූ නමයක (රු. 34,597,671.89) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයක් (9%) හා තවත් රුපියල් පනස් දෙලක්ෂ පනස් පන් දහස්

අටසිය හැත්තෑ නමයයි ශත පනස් එකක (රු. 5,255,879.51) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයක් (6%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.03.31 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.03.17 දින "දිවයින", "තිනක්කුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2023.08.02 දින ප.ව. 2.00 ට පළමු උපලේඛනයේ දේපල හා ප.ව. 2.30 ට දෙවන උපලේඛනයේ දේපල** පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර නගර සභා සීමාවන් තුළ සහ පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පට්ටිය දකුණ 686B දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පට්ටිය දකුණ පිහිටි ගාලු පාර, නිර්මල මාවත, වරිපනම් අංක 18 දරන "දොඹගහවත්ත හි ලොට් 8" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. වී. ටී. පී. ජයසුන්දර යන අය විසින් සාදන ලද 2016 අප්‍රේල් 20 දාතම හා අංක 16/83 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 8 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කලින් වඩුගේ ජෝශප් ප්‍රනාන්දු දැන් ජෝ ෆොන්සේකාගේ ඉඩම, නැගෙනහිරට : කලින් වඩුගේ ජෝශප් ප්‍රනාන්දු දැන් ජෝ ෆොන්සේකාගේ ඉඩම වර්තමානයේ (අඩි 10 පළල පාර), දකුණට : නිර්මල මාවත සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 7 සහ 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නවයයි දශම පහක් (පර්. 19.5) හෝ හෙක්ටයාර 0.0493ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 16/83 දරන පිඹුරට අනුව ය.

අංක 16/83 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 8 පහත ඉඩමේ නැවත මිනුමකි :

එකී පට්ටිය දකුණ පිහිටි "දොඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ද එෆ්. ඩබ්ලිව් ගුණවර්ධන යන අය විසින් සාදන ලද 1966 ජුනි 05 දාතම හා අංක 58 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 8 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරටඃ කලින් වඩුගේ ජෝශප් ප්‍රනාන්දු දැන් ජෝ ෆොන්සේකාගේ ඉඩම, නැගෙනහිරට : කලින් වඩුගේ ජෝශප් ප්‍රනාන්දු දැන් ජෝ ෆොන්සේකාගේ ඉඩම, දකුණට : නිර්මල මාවත සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 3 සහ 7 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නවයයි දශම පහක් (පර්. 19.5) හෝ හෙක්ටයාර 0.0493ක් විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 58 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 674/133 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ පානදුර කෙසෙල්වත්ත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මිරියාවත්ත 672C දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කෙසෙල්වත්ත පිහිටි දිග්ගල - තොටුපල පාර, වරිපනම් අංක 80 දරන "ඒදණ්ඩ කුඹුර දැන් උස් ඉඩම"යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. මල්වැන්න යන අය විසින් සාදන ලද 2013 මාර්තු 13 දාතම හා අංක 5232 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : දිග්ගල පාර, නැගෙනහිරට : චාල්ස් පීටර් ප්‍රනාන්දුගේ දේපළ, දකුණට : කුඹුර දැන් කලින් හල්පේවත්තගේ උස් ඉඩම සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවයි දශම තුනයි පහක් (පර්. 15.35) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5232 දරන පිඹුරට අනුව ය.

අංක 5232 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 2A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී කෙසෙල්වත්ත පිහිටි "ඒදණ්ඩ කුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. අහංගම යන අය විසින් සාදන ලද 1966 ඔක්තෝබර් 08 දාතම හා අංක 867 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : දිග්ගල පාර, නැගෙනහිරට : චාල්ස් පීටර් ප්‍රනාන්දුගේ දේපළ, දකුණට : කලින් හල්පෙවත්තගේ කුඹුර සහ බස්නාහිරටඃ මෙම ඉඩමේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම අටක් (පර්. 16.8) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 867 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 448/139 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07 - 123/3

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ඒ. ඥාණවිපුල සහ ආර්. එස්. එල් අබේවික්‍රම
ගිණුම් අංක : 1028 5723 0506.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.01.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැත්තෑ අට ලක්ෂ දහ අට දහස් දෙසිය හැත්තෑ දෙකයි ශත අනූ තුනක (රු. 7,818,272.93) මුදල ද, 2023 ජනවාරි මස 04 වැනි දින සිට මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2021 දෙසැම්බර් මස 04 දාතම දරන හිමිකම් සහතිකපත් අංක 0020911 : Hambantota උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ දෙලක්ෂ හැත්තෑ එක් දහස් හයසිය හැට අටයි ශත විස්සක (රු. 7,271,668.20) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටක් (8%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.03.24 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.03.16 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2023.08.23 වැනි දින** පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහරාම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මැදවෙලන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මැදවෙලන/දෙබරවැව පිහිටි ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද කැඩැස්තර සිතියම් අංක 830068 (බ්ලොක් අංක 01) නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 115 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරටː මෙම ඉඩමේ ලොට් 109, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 116, දකුණට : මෙම ඉඩමේ ලොට් 114, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 114 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි තුනයි හතරයි අටක් (0.0348 Hectares) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී කැඩැස්තර සිතියම් අංක 8300068ට අනුව හිමිකම් සහතිකපත් අංක 0020911ːHambantota යටතේ හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 115 වශයෙන් ලකුණුකොට ඇති එකී ඉඩම් කොටස නැවත මැන ඇති අතර බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්න රාජා විසින් සාදන ලද 2016 ඔක්තෝබර් 04 දාතම හා අංක 2016/10/88 දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් දැන් ලකුණුකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

07 - 124

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එන්. පී. ජී. එස්. සංජීව
ගිණුම් අංක : 1114 5425 8742.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.01.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි පන් ලක්ෂ හැට හත් දහස් අටසිය අනූ හයයි ශත විසි දෙකක (රු. 20,567,896.22) මුදල ද, 2023 ජනවාරි මස 08 වැනි දින සිට අංක 2294 උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි අනූ ලක්ෂ අසූතුන් දහස් හයසිය හැට හතරයි ශත හැත්තෑ තුනක (රු. 19,083,664.73) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම්

ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.04.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ 2023.04.06* ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2023.08.10** වැනි දින **ප. ව. 3.45** ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තලවතුගෙ ාඩ බටහිර අංක 493 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තලවතුගොඩ පිහිටි පාසල් මාවත වරිපනම් අංක 115/16 දරන "කෝන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සිරිල් වික්‍රමගේ යන අය විසින් සාදන ලද 2012 අප්‍රේල් 12 දාතම හා අංක 7449B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් Y වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 7449A දරන පිඹුරේ නිරූපිත ලොට් X, නැගෙනහිරට : අංක 4107 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 (අඩි 15 පළල පාර), දකුණට : කෝන්ග හවත්ත (කොටසක්) බස්නාහිරට : නැසීගිය අමාරිස්අප්පුගේ කෝන්ගහවත්තහී කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයක් (A.0, R.0, P.9) හෝ හෙක්ටයාර 0.0227 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහගොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 7449B දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව C 107/127 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන සිරිල් වික්‍රමගේ යන අය විසින් සාදන ලද 1999 නොවැම්බර් 16 දාතම හා අංක 4107 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 (පාර සඳහා වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

07 - 125

### ලංකා බැංකුව

## 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 82603500, 82642794 සහ 82993021.

කැකිරාව මරදන්කඩවල පාර අංක 33 "කුවුන්" ප්‍රින්ටර්ස් හි රණසිංහ ආරච්චිලාගේ අනුජා දීප්ති මහත්මිය විසින් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023.05.19 දිනැති අංක 2332 දරන *ගැසට් පත්‍රයේ* හා 2023 මැයි මස 17 වැනි දින ''දිනමිණ'', 'තිනකරන්'' හා ''ඩේලිනිව්ස්'' යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදල් ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම,

**2023 අගෝස්තු මස 11 වැනි සිකුරාදා දින පෙ. ව. 11.30** ට කොළොන්නාව, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමුවැනි උපලේඛනය

එකී උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා ප්‍රාදේශීය සභා සීමාවේ දකුණු කැලෑගම් කෝරළේ, අංක 620, - දුම්රිය නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දුම්රිය නගරයේ (පනික්කන්කුලම) පිහිටි "ගොඩ ඉඩම" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එම්. කේ. තෙන්නකෝන් විසින් සාදන ලද 2014.12.31 දිනැති අංක 2014/609 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 02, උතුරට : අංක 2014/609 දරන පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට : පාර (RDA) සහ අනුරාධපුර ප්‍රධාන පාරට වෙන් කළ කොටස ද, දකුණට : ඇන්සිනෝනාගේ ඉඩම ද, බස්නාහිරට : එස්. එම්. පියතිස්සගේ ඉඩම ද, මායිම්ව රූඩ් එකයි පර්චස් දාහතයි දශම නවයක (රූ. 1, පර්. 17.9) *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම එකයි හතරයි හයයි හතරක (හෙක්. 0.1464) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ,

වගාවන් හා වෙනත් සියලු දේ සමග වේ. මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O. R/9/95 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු ජී. එම්. කේ. තෙන්නකෝන් විසින් මැතක දී මැන සාදන ලද 2017.11.18 දිනැති අංක 2514 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

එකී පනික්කුලම ග්‍රාමයෙහි පිහිටි "ගොඩ ඉඩම" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එම්. කේ. තෙන්නකෝන් විසින් සාදන ලද 2017.11.18 දිනැති අංක 2514 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : අංක 2014/609 දරන පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට : පාර (RDA) ද, දකුණට : ඇන්සිනෝනාගේ ඉඩම ද, බස්නාහිරට : එස්. එම්. පියතිස්සගේ ඉඩම ද, මායිම්ව රූඩ් එකයි පර්චස් දාහතයි දශම නවයයි (රූ. 1, පර්. 17.9) *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම එකයි හතරයි හයයි හතරක (හෙක්. 0.1464) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද සමග වේ.

### ඉහත සඳහන් දෙවන උපලේඛනය

වෙන් කිරීම්

1. සියලු ඛනිජ (ඔප්පුවේ මෙම යෙදුමට වටිනා ගල් ද ඇතුළත් වේ) පිළිබඳ හිමිකම් සහ ඒවා හෑරීම, සෙවීම, ඒ සම්බන්ධව වැඩ කිරීම සහ එවන් ඛනිජ බැහැරට ගෙන යාමේ අයිතිය රජයට වෙන් කර ඇත.

2. මෙම ඉඩමට අයිතිකරුවන් සතු හිමිකම මෙම ඔප්පු ප්‍රදානයේ දිනයේ සිට මාර්ග අයිතියට හා පවත්නා වෙනත් පරවශ්‍යතාවන්ට යටතේ වේ.

කොන්දේසි

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් අක්කර 1/4 මඩ ඉඩමෙන් අක්කර 1 1/2 වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති බිම් ප්‍රමාණයකට වඩා අඩු උප බෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතු ය.

2. අයිතිකරු විසින් මෙහි අක්කර 1/4 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතු ය.

3. කිසිවකුට ඉහත කොන්දේසි 1හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග, කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතු ය.

දුරකථන අංක 025 2275090 මගින් කැකිරාව ලංකා බැංකු ශාඛාවේ කළමනාකාරිණිය අමතා ලංසුකරුවන්ට පවත්නා හිමිකම් ඔප්පු සහ මෙම දේපළට අදාළ වෙනත් සම්බන්ධිත ලේඛන කිසිදු බාධාවකින් තොරව පරීක්ෂා කළ හැකි අතර මෙම පරීක්ෂා කිරීම 2023.07.20 වැනි දින සිට සිදු කළ හැකිය.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එස්. ඩබ්. සිරිවර්ධන මිය,
ශාඛා කළමනාකාරිණී.

2023 ජනවාරි, 10 වැනි දින,
ලංකා බැංකුව,
කැකිරාව ශාඛාව.

07 - 131

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව අමරදාසගේ මනෝජ් ගුණවර්ධන යන අය බන්ධනදායින්/ උකස්කරු වශයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. නමින් ගිරිඋල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඉන්දික බණ්ඩාර ජයතිලක විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 04 වැනි දින අංක 8946 දරන සහ පිළිවෙලින් 2018.10.01 සහ 2019.05.24 වැනි දින දරන අංක 10444 සහ 10959 දරන උකස් බැඳුම්කර මගින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කර ඇති පහත විස්තර වන දේපළ.

**2023 ක් වූ අගෝස්තු මස 25 වැනි දින පෙ.ව. 11.00** ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ විස්තර* : වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ වල්පිටිගම ග්‍රාම නිලධාරි වසමේ වල්පිටිගම ගමෙහි පිහිටි "ගලගාවවත්ත සහ ගලගාවවත්තහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බාලෙන්දිරන් විසින් මැන සාදන ලද 2015.12.27 වැනි දින අංක 2015.12.01 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 03 දරන බෙදා වෙන් කළ බිම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 02.

*දේපලට පිවිසීම* : කුලියාපිටිය නගර මධ්‍යයේ සිට මාදම්පේ මාර්ගයේ කිලෝමීටර 1.7 ක් පමණ ගමන්ගෙන මීගහකොටුව හන්දිය දක්වා පැමිණ එතැනින් වමට ඇති පන්නල - කුලියාපිටිය මාර්ගයට පිවිස එම පාරේ කිලෝමීටර 1.4 ක් ගමන්ගෙන දකුණු පසින් පිහිටා ඇති දණ්ඩගමුව පාරට පිවිස එම පාරේ කිලෝමීටර් 03 ක් පමණ ගමන්ගෙන දකුණට හැරී එම පාරේම කිලෝමීටර් 2.7 ක් පමණ ගමන්ගෙන එතැනින් වමට ඇති ප්‍රාදේශීය සභා පාරට පිවිස (බස් නැවතුමට මෙපිටින්) එම පාරේ මීටර් 950ක් පමණ ගමන්ගෙන වමට ඇති වංගුව පසුකල වහාම දකුණු පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වේතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

අනෙකුත් විස්තර සඳහා විමසන්න : කළමනාකරු, නීති අංශය, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී., අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

දුරකථන අංකය : 011 4682502

එන්. යූ. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර,
දුරකථන අංකය : 081-2210595/ 077 3067360/ 076 1375993

07 - 136

---

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව අනුරාධපුර සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි ඉන්දික ජුවලර්ස් යන නාමය, විලාසය හා අභිධානය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන අනුරාධපුර පදිංචි ලියනගේ සෝමරත්න බාලසූරියලාගේ වසන්ත විජේවර්ධන සහ මනෝජ් එරන්ද බණ්ඩාර ලියනගේ යන අය ණයකරුවන් වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී. නමින් ප්‍රසිද්ධ නොතාරිස් එස්.කේ. එන්. ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද අංක 8547 සහ 8301 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කර ඇති පහත විස්තර වන දේපල,

**2023 ක් වූ අගෝස්තු මස 24 වැනි දින පෙ. ව. 11.00** ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ නුවරගම් පළාත නැගෙනහිර අංක 247 ග්‍රාම සේවා නිලධාරි වසම කනදරා කෝරලේ, නුවරගම් පළාත අනුරාධපුර නගර සභා සීමාවන් තුළ අනුරාධපුර නව නගරය පියවර 1 හි පිහිටි "නුවරවැව කැලේ"

නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ටී. ගලගෙදර විසින් 2011.10.16 වැනි දින සාදන ලද අංක 2790 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ,

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 9.54 (හෝ හෙක්ටයාර් 0.02413)

*දේපළට පිවිසීම.* - අනුරාධපුර පොදු වෙළඳ පොළ අසල සිට පොදු වෙළඳ පොළ පාරේ පැරණි බස් නැවතුම් පොළ දෙසට මීටර් 200ක් පමණ ගමන් ගත් පසු අදාළ දේපළ මෙම පාරේ වම් පසින් පිහිටා ඇත. මෙම දේපළ කඩ අංක 6 සහ 7 ලෙසින් හඳුනා ගත හැක.

යෝජනා සම්මුතිය සඳහා 2023.04.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2023.02.23 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා 2023.02.24 වැනි දින තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු - පුනරුත්ථාපන හා ණය අයකිරීම් අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී., අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011 - 2371371

එන්. යූ. ජයසූරිය,
"ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්",
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර.
දුරකතන අංක : 081 2210595, 077 3067360, 076 1375993

07 - 137

## ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ඉතා වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නොච්චියාගම පදිංචි ප්‍රදීප් ප්‍රියන්ත ජයවර්ධන සහ මහබුලන්කුලම පදිංචි හේරත් මුදියන්සේලාගේ සෙනරත් බණ්ඩාර ධර්මප්‍රිය හේරත් යන අය බන්ධනදායීන් වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී. නමින් ප්‍රසිද්ධ නොතාරිස් එස්.කේ. එන්. ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද 2018 ජූලි මස 20 වැනි දිනැති අංක 8846 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කර ඇති පහත විස්තර වන දේපළ,

**2023 ක් වූ අගෝස්තු මස 24 වැනි දින ප. ව. 1.30 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහ නුවරගම් පළාත, මධ්‍යම ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 281 - උලුක්කුලම ග්‍රාම නිලධාරී වසම තුළ උලුක්කුලම ගමේ පිහිටි "උලුක්කුලම කැලේ" නමැති ඉඩමට බලයලත් මානක කේ. එම්. පී. රාජකරුණා විසින් 2018.04.22 වැනි දින මැන සාදන ලද අංක 01470 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නමැති ඒකාබද්ධ කල බිම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ,

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 02.

*දේපළට පිවිසීම.* - අනුරාධපුර නව නගරයේ සිට අනුරාධපුර - පුත්තලම් මාර්ගයේ කිලෝමීටර් 2.5 ක් පමණ ගමන්ගෙන 2 කණුව දක්වා ගමන්ගෙන එතැනින් දකුණට ඇති පුත්තලම් පාරට පිවිස එම පාරේ කිලෝමීටර් 7 ක් පමණ ගමන්ගත් විට මෙම පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා තිබේ. (උලුක්කුලම හන්දියේ ශ්‍රී සුමන ත්‍රිපිටක පන්සල ඉදිරිපිට)

යෝජනා සම්මුතිය සඳහා 2023.05.12 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2023.04.26 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා 2023.04.24 වැනි දින තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින්

හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු - පුනරුත්ථාපන හා ණය අයකිරීම් අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී., අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.
දුරකථන අංක : 011 - 2371371

එන්. යූ. ජයසූරිය,
"ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්",
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර.
දුරකතන අංක : 081 2210595, 077 3067360, 076 1375993

07 - 138

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ඉතා වටිනා සියලු පහසුකම් සහිත පදිංචියට/ව්‍යාපාරයකට සුදුසු දේපළක්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව අංක 102, රත්මල්කඩුව, ගම්පොල යන ලිපිනයේ පදිංචි නිරෝශන් චතුරංග වීරසිංහ යන අය ණයකරු වශයෙන් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර වන දේපල,

**2023 ක් වූ අගෝස්තු මස 14 වැනි දින ප. ව. 2.00 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1116 - ජයමාලපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ජයමාලපුර ගමේ පිහිටි මිනුම්පතිවරයා විසින් සාදන ලද අංක 320016 දරන කැඩැස්තර පිඹුරේ අංක 02 දරන ඉඩම් කට්ටියේ ලොට් අංක 457, ලොට් අංක 458 හා ලොට් අංක 459 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස් සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ,

ඉඩමේ ප්‍රමාණය : ලොට් අංක 457 - හෙක්. 0.0141
ලොට් අංක 458 - හෙක්. 0.00487
ලොට් අංක 459 - හෙක්. 0.0091

*දේපළට පිවිසීම*. - ගම්පොළ නගරයේ සිට නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් 3.2 ක් පමණ ගමන් ගෙන ජයමාලපුර (බෝක්කු අංක 4/2) 6 වන පටුමග හන්දිය අසල අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුතිය සඳහා 2023.06.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2023.05.18 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා 2023.05.22 වැනි දින තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3000.00,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු සිල්ලර අයකිරීම් අංශය, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී., අංක 40, නවම් මාවත, කොළඹ 02.
දුරකථන අංක : 011 - 2448 448

එන්. යූ. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 077 3067360/ 076 1375993

07 - 139

## යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ නිවේදනය

යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව මාතලේ, වරකාමුර වතුයායේ, අංක 07 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ලියාපදිංචි අංක PV 95313 දරන මාම් බිස්කට් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් යන අය බන්ධදායී වශයෙන් යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. නයන්ත්‍රා සහතික කරන ලද අංක 1113 සහ 2022.10.18 වැනි දින දරන මුදාහැරීමේ ඔප්පුව සමග කියවිය යුතු ප්‍රසිද්ධ නොතාරිස් ජී. ටී. යහතුගොඩ සහතික කරන ලද අංක 990 සහ 2018.12.28 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මගින් යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී වෙත උකස් කර ඇති පහත විස්තර වන දේපළ,

**2023 ක් වූ අගෝස්තු මස 10 වැනි දින ප. ව. 2.00 ට** එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහ අකුරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ නිරැල්ල ග්‍රාම නිලධාරි වසමේ නිරැල්ලේ පිහිටි "වැලිකුඹුරවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. එම්. ටී. ආර්. විජේරත්න විසින් මැන සාදන ලද අංක 2893 සහ 2014.12.02 සහ 2014.12.05 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය රූඩ් 02, පර්චස් 03.

*දේපළට පිවිසීම.* - අකුරණ බස් නැවතුම අසල සිට මාතලේ මාර්ගයේ මීටර් 850 ක් පමණ ගමන්ගෙන එතැනින් වමට ඇති නිරැල්ල මාර්ගයට පිවිස එම පාරේ මීටර් 750 ක් පමණ ගමන්ගත් විට මෙම පාරේ වම් පසින් අදාළ දේපල පිහිටා තිබේ. (නිරැල්ල පාසල පසුකර මීටර් 200 යි)

යෝජනා සම්මුතිය සඳහා 2023.05.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, මව්බිම, සිලෝන් ටුඩේ හා තිනක්කුරල් යන දිනපතා පුවත්පත්ද බලන්න.

ගෙවීමේ ක්‍රමය - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදලේ මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් 10% ( සියයට දහයක්),
(02) පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකිණුම් බදු,
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකිණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
(04) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
(05) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000/-
(06) විකිණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3000/-

